# ක්‍රියා මාර්ගය සම්පූර්ණ කිරීම හා එය ක්‍රියාවට දැමීම

**ලියොන් ට්‍රොට්ස්කි**

**1938 ජුනි 7**

ක්‍රියා මාර්ගයේ වැදගත්කම වන්නේ පක්ෂයේ වැදගත්කම යි. පක්ෂය වනාහි පන්තියේ පෙරමුණු බළ ඇණිය යි. පක්ෂය ගොඩ නගනු ලැබ ඇත්තේ, ඉතා ම දැනුවත්, ඉතා ම දියුණු, ඉතා ම කැප වූ කොටස්වලින් කෙරෙන තේරීමක් වන අතර එහි සංඛ්‍යාත්මක ශක්තියට නිරනුපාත වූ වැදගත් ඓතිහාසික දේශපාලන කාර්යභාරයක් පක්ෂයට ටු කළ හැකි ය. කුඩා පක්ෂයක් වන ගමන් ම ඊට දැවැන්ත කොටසක් ඉටු කළ හැකි ය. උදාහරණයක් සලකතොත්, 1905 රුසියානු විප්ලවයේ දී බෝල්ශේවික් කණ්ඩායමට දස දහසකට වඩා සාමාජිකයෝ නොසිටියහ: මෙන්ශේවික්වරුන්ට සිටියේ දස දහසත්, දොළොස් දහසත් අතර ප්‍රමාණයකි. එය උපරිමය යි. ඒ වන විට දී ඒ කණ්ඩායම් දෙක ම, එක ම පක්ෂයට අයත් වූ අතර, සමස්තයක් වශයෙන් පක්ෂයට සිටි සාමාජික සංඛ්‍යාව විසි දහසේ සිට විසි දෙදහස දක්වා ප්‍රමාණයකට වැඩි නොවී ය. නිවැරදි පිළිවෙතට හා ඒකාබද්ධතාවට ස්තුති වන්ට, පක්ෂය, මුළු රට පුරා සෝවියට් සභා මෙහෙයවී ය. රුසියානු සහ ඇමරිකානු හෝ වෙනත් පැරණි ධනපති රටක කම්කරු පන්තිය අතර ඇති වෙනස වන්නේ රුසියානු කම්කරු පන්තිය, වෘත්තීය සමිති පිළිබඳ සහ ගතානුගතික ප්‍රතිසංස්කරණවාදය පිළිබඳ කවර හෝ සම්ප්‍රදායකින් තොර මුළුමනින් නැවුම් හා නොඉඳුල් කම්කරු පන්තියක් විම ය යන විරුද්ධතාව මෙහි දී මතු කළ හැකි ය. එය මඟ පෙන්වීමක් අවශ්‍යවූ තරුණ, නැවුම් හා නො ඉඳුල් කම්කරු පන්තියක් වූ අතර මේමග පෙන්වීම සොයමින් පසු විය: සමස්තයක් වශයෙන් පක්ෂයට විසි දහසකට වඩා කම්කරුවන් නො සිටීම පිළිබඳ කරුණ තිබිය දී ම සටනේ යෙදුණු දස ලක්ෂ විසි තුනක් කම්කරුවෝ මේ පක්ෂය විසින් මෙහෙයවනු ලැබුණි.

පක්ෂය යනු කුමක් ද? ඒකාබද්ධතාව සමන්විත වන්නේ කුමකින් ද? මේ ඒකාබද්ධතාව යනු සිද්ධින් හා කර්තව්‍යයන් පිළිබඳ පොදු අවබෝධය යි. මේ පොදු අවබෝධය යනු - පක්ෂයේ ක්‍රියා මාර්ගයයි. මිලේච්ඡ ජනයාට නො අඩු ව තරමකින් වර්මාන කම්කරුවාට ද අවිආයුධ නොමැතිව වැඩ කළ නො හැකිවාක් මෙන්ම පක්ෂයට ක්‍රියාමාර්ගය එහි උපකරණය වෙයි. ක්‍රියා මාර්ගය නොමැති කල්හි, එක් එක් කම්කරුවා සිය උපකරණ ක්ෂණ නිර්මාණ ලෙස තනා ගත යුතු ය. නැත හොත් ක්ෂණ නිර්මිත අවි සොයා ගත යුතු ය: මෙහි දී එක් අවියක් අනෙක් අවිය සමඟ පරස්පරව යයි. පොදු සංකල්පවල පදනම මත පෙරමුණු බළ ඇණිය සංවිධානය වී ඇති විට දී පමණක් අපට ක්‍රියාත්මක විය හැකි වෙයි.

අද වන තුරු අපට ක්‍රියා මාර්ගය නො පැවතියේ යැයි කෙනෙකුට කිව හැකි ය. එහෙත් අපි ක්‍රියා කර ඇත්තෙමු. එනමුදු මෙම ක්‍රියා මාර්ගය සකසා ගැනුණේ විවිධ ලිපි හා නොයෙක් යෝජනා

ආදිය යටතේ ය. මේ අර්ථයෙන් කෙටුම්පත් ක්‍රියා මාර්ගය, නව නිර්මාණයක් නියෝජනය නොකරයි. එය එක් එක් පුද්ගලයෙකු විසින් කෙරුණු ලේඛනගත කිරීමක් නො වී ය. එය අද දක්වා කෙරුණු සාමූහික වැඩ කටයුතුවල කුළුගැන්වීම යි. එළඹ ඇති තත්ත්වය පිළිබඳව සහෝදරවරුන්ට අදහසක්, පොදු අවබෝධයක් ලබා දීම පිණිස එවැනි කුළුගැන්වීමක් පරම වශයෙන් අවශ්‍ය වෙයි. සුලු ධනේශ්වර අරාජකවාදීන් හා බුද්ධිමත්හු පක්ෂයකට පොදු අදහස් හා පොදු ආකල්පයන් ලා දීම සඳහා සම්මාදම් වීමට බිය වෙති. ඊට ප්‍රතිවිරුද්ධව ඔවුහු සදාචාරාත්මක වැඩ පිළිවෙළවල් ප්‍රාර්ථනා කරති. එහෙත් අප සම්බන්ධයෙන් ගත් කල මේ ක්‍රියා මාර්ගය වනාහි පොදු අත්දැකීම්වල ප්‍රතිඵලය යි. එය කිසිවෙකු මත බලෙන් පටවා නැත. පක්ෂයට බැඳෙන කවරෙකු වුව එසේ කරන්නේ ස්වේච්ඡාවෙනි.

මේ සම්බන්ධයෙන් සලකන කල, අප විසින්, අවශ්‍යතාවට ප්‍රතිවිරෝධී ලෙස නිදහස යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි අවධාරණය කිරීම වැදගත් ය යි මම විශ්වාස කරමි. අපට නිදහස් පුද්ගලත්වයක් තිබිය යුතු ය. යන්න බොහෝ විට සුලු ධනේශ්වර සංකල්පයකි. එය හුදෙක් මිථ්‍යාවකි. වරදකි. අප නිදහස කැමැත්තක් නැත. මම බීර වීදුරුවක් පානය කිරීමට අපේක්ෂා කරන විට මා ක්‍රියා කරන්නේ නිදහස් මිනිසෙකු වශයෙන් මුත් බීර සඳහා අවශ්‍යතාව, මා නිර්මාණය කළේ නැත. එය මාගේ ශරීයෙන් මතු වන්නකි. මා එය ක්‍රියාවට දමන්නා පමණි. එහෙත් මා මගේ ශරීරයේ අවශ්‍යතාවන් අවබෝධ කර ගන්නා තාක් දුරට හා ඒවා දැනුවත්ව සන්තර්පණය කිරීමට සමත් වන තාක් දුරට, නිදහස පිළිබඳ සංවේදනය, අවශ්‍යතාව තේරුම් ගැනීම හරහා එළඹෙන නිදහස මා සතු වෙයි. මෙහි දී මගේ ශරීරයේ අවශ්‍යතාව පිළිබඳ නිවැරදි අවබෝධය කවර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වුව ද සත්වයන්ට පවතිනඑක ම යථා නිදහස වෙයි. මිනිසා ද සත්වයෙකි. මෙය ම පන්තිය සම්බන්ධයෙන් ද සත්‍යය වෙයි. පන්තිය සඳහා ක්‍රියා මාර්ගය සුර ලොවින් පිත නොවේ. අපට එළඹිය හැක්කේ අවශ්‍යතාව පිළිබඳ අවබෝධයක් කරා පමණි. එක් විටක දී එය මගේ ශරීරයේ අවශ්‍යතාව යි. අනෙක් විට දී එය සමාජයේ අවශ්‍යතාව සංගෘහිත කිරීම ක්‍රියා මාර්ගය යි. පන්තියේසියලු සාමාජිකයන් සම්බන්ධයෙන් අවශ්‍යතාව සමාන වන හෙයින් අපට කර්තව්‍යයන් පිළිබඳ පොදු අවබෝධයක් කරා එළඹිය හැකි වේ. මේ අවශ්‍යතාව පිළිබඳ අවබෝධය ක්‍රියා මාර්ගය වේ.

තව දුර ගොස් අපට කිව හැක්කේ, ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව දැනුවත් දැවැන්ත හතුරු පෙරමුණකට එරෙහි විප්ලවවාදී පක්ෂයක් වන හෙයින් අප පක්ෂයේ විනය ඉතා දැඩි විය යුතු බව ය. දැන් අපට පහර දෙනු ලබන්නේ ධනපති පන්තිය විසින් පමණක් නොව ධනපති ඒජන්තයන් අතුරින් ඉතා ම විසකුරු ඒජන්තයන් වන ස්ටැලින්වාදීන් විසිනුත් ය. පරම විනයගත භාවයක් අවශ්‍ය ය, එහෙත් එය පොදු අවබෝධයක් තුළින් එන්නේ නම් එය පෞරුෂයේ ප්‍රකාශනයකි. එසේ නො වෙතොත් එය වියගසකි. එවිට දී විනය මගේ නිදහස් පුද්ගල භාවයේ ප්‍රකාශනයකි. එය පුද්ගලික කැමැත්ත හා පක්ෂය අතර කැමැත්තෙන් හෙයිනි. ක්‍රියා මාර්ගය ද මේපදනමෙහි පිහිටා ඇත.

මෙම ක්‍රියාමාර්ගය නියත දේශපාලන හා සදාචාරාත්මක පදනමක පිහිටන්නේ අප එය ඉතා හොඳින් තේරුම් ගෙන සිටී නම් පමණි.

කෙටුම්පත් ක්‍රියා මාර්ගය පරිපූර්ණ ක්‍රියාමාර්යක් නො වේ. මේ ක්‍රියා මාර්ගයෙහි ඇතැම් නො සඳහන් දෑ ඇති බවත් එහි ස්වාභාවය නිසා ම මේ ක්‍රියා මාර්ගයට අයත් නොවන දෑ පවතිව බවත් අපට කිව හැකි ය. ක්‍රියා මාර්ගයට අයත් නැති දෑ නම් විවරණයන් ය. සටන් පාඨ පමණක් නොව ප්‍රතිවාදීන් ට එරෙහි විවරණ හා විවාදාත්මක කරුණු මේ ක්‍රියා මාර්ගයට ඇතුළත් වී ඇත. එහෙත් එය පරිපූර්ණ ක්‍රියා මාර්ගයක් නො වේ. පරිපූර්ණ ක්‍රියා මාර්ගයක, අධිරාජ්‍යවාදී යුගයේ වර්තමාන ධනවාදී සමාජය - අර්බුදයට හේතු, විරැකියාවේ වැඩීම යනාදිය - පිළිබඳ න්‍යායික පැහැදිලි කිරීමක් අඩංගු විය යුතු ය. මෙම කෙටුම්පතේ දී මේ විශ්ලේෂණය පළමු වන පරිච්ඡේදයේ දී ලුහුඬින් සාරාංශගත කර ඇතුවා පමණි. ඊට හේතු මේ දේවල් ගැන අප විසින් ලිපිලේඛන හා පොත් යනාදියෙහි සඳහන් කර තිබීම යි. අපි තව තවත් හා වඩා හොඳිනුත් ලියන්නෙමු. එහෙත් ප්‍රායෝගික අවශ්‍යතා නුව ගත් කල මෙහි සඳහන් දේ සෑහෙන්නේ අප සියල්ලන් එක ම අදහස් දරන හෙයිනි. ක්‍රියා මාර්ගයේ ප්‍රාරම්භය සම්පූර්ණ නැත. පළමු වන පරිච්ඡේදය පූර්ණ විස්තර කිරීමක් නොව ඇඟවුම් කිරිමක් පමණිත එසේ ම ක්‍රියා මාර්ගයේ අවසානය ද පරිපූර්ණ නොවේ. ඊට හේතුව, මෙහි දී අප සමාජ ඒකාධිපතිත්වය කරාත් එකාධිපතිත්වය සමාජවාදී සමාජය කරාත් පරිවර්තනය වීම, එහි දී කතා කර නොතිබීම ය. මෙය පාඨකයා ගෙන එන්නේ එළිපත්ත කරා පමණි. එය අද සිට සමාජවාදී විප්ලවයේ ආරම්භය දක්වා ක්‍රියාකාරීත්වය සඳහා ක්‍රියා මාර්ගයකි. ප්‍රායෝගික දෘෂ්ටි ආස්තානයෙන් සලකන කල දැන් අපට වඩාත් වැදගත් වන්නේ කම්කරු පන්තියේ විවිධ ස්ථරයන්, සමාජ විප්ලවයේ දිසාවට මෙහෙයවන්නේ කෙසේ ද යන්න යි. කෙටුම්පත් ක්‍රියා මාර්ගය හැදෑරීමට හා විවේචනය කිරීමට පමණක් නොව මහජනතාවට එය ඉදිරිපත් කිරීමේ ක්‍රම විස්තාරණය කර ගැනීමට ද නිව් යෝක්හි සහෝදරවරුන් විසින් කවයක් සංවිධානය කිරිම ආරම්භකර ඇති බ වමට අසන්ට ලැබුණි. මා විශ්වාස කරන්නේ අප පක්ෂය විසින් උපයෝගී කර ගත හැකිහොඳ ම ක්‍රමය එය බව යි.

ක්‍රියා මාර්ගය යනු ප්‍රථම සමීපකරණය පමණි. ඉදිරි කාල පරිච්ඡේදයේ ජාත්‍යන්තර සම්මේලන යසඳහා ඉදිරිපත් කරනු ලැබීමේ අර්ථය අතින් එය බෙහෙවින් සාමාන්‍ය ස්වරූපයක් ගෙන ඇත. එය ප්‍රකාශිත කරන්නේ සමස්ත ලෝක වර්ධනයෙහි පොදු ප්‍රවණතාවය යි. අර්ධ යටත් විජිත හා යටත් විජිත රටවල් සම්බන්ධයෙන් යොමු වූ කෙටි පරිච්ඡේදයක් මෙහි දි අපට හමු වේ. ෆැසිස්ට් රටවල් හා සෝවියට් සංගමය වෙනුවෙන් වෙන් වූ පරිච්ඡේද යනාදි වශයෙන් පරිච්ඡේද වෙන් වී ඇත. ලෝක තත්ත්වයෙහි සාමාන්‍ය අංගලක්ෂණයන්, ඒවා සියල්ල අධිරාජ්‍යවාදී ආර්ථිකයේ පීඩනය යටතේ පවතින හෙයින්, ඒවා පොදු වේ. එහෙත් හැම රටක ම ඒවාට ආවේණික කොන්දේසි පවතී. යථා ජීවමාන දේශපාලනය පටන් ගත යුත්තේ එක් එක් රටෙහි හා ඇතැම් විට රටක එක් එක් කොටසෙහි ආවේණික කොන්දේසිවලිනි. ඇමරිකාවේ ජීවත් වන සෑම සහෝදරයෙකු ම ක්‍රියා මාර්ගය කෙරෙහි බැරෑරුම් ප්‍රවිෂ්ටයක් ඇතිකර ගැනීම ඔහුගේ පළමු යුතුකම වන්නේ මේ නිසා ය.

ක්‍රියා මාර්ගය විස්තාරණය කිරීමේ දී අනතුරු දෙකක් පවති. පළමු වැන්න නම, පොදු වියුක්ත සීමාවෙහි රැඳී සිටිමින් ප්‍රදේශයේ වෘත්තීය සමිති සමග යථා සම්බන්ධතාවකින් තොරව පොදු සටන් පාඨ පුනරුච්චාරණය කිරීම යි. කට්ටිවාදී වියුක්තකරණයේ දිසාවනතිය එය යි. අනෙක් අනතුර එහි ප්‍රතිවිරුද්ධය යි. පොදු විප්ලවවාදී පිළිවෙත අත් හැරී යාමට තළුම් ප්‍රාදේශිය හා සුවිශේෂ කොන්දේසිවලට අනුගත වීම යි. මා විශ්වාස කරන්නේ, ඇමරිකාවේ දී දෙවන අනතුර වඩා ක්ෂණික බව යි. මිලිටරිකරණය, සන්නද්ධධිකට් යනාදි ප්‍රශ්නවල දී ඉතා විශේෂ වශයෙන් මට එය මතක ය. ඒවා කම්කරුවන් සම්බන්ධයෙන් යථා වන්නේ නැතැයි ඇතැම් සහෝදරවරු බියට පත් වූහ.

ඉතාලියේ ෆැසිස්ට්වාදයේ නැගීම ගැන ඉතාලි කම්කරුවෙකු විසින් ලියන ලද ප්‍රන්ස පොතක් පසු ගිය දින කීපයේ දී මම කියවූයෙමි. ඔහු සමාජවාදියෙකු වූයේ ය. එහෙත් උනන්දුව දනවනසුලු වන්නේ ඔහු ඉදිරිපත් කරන නිගමන නො ව, ඔහු ඉදිරිපත් කරන කරුණු ය. විශේෂයෙන් ම, 1920 - 21 කාලයේ ඉතාලි කම්කරු පන්තිය පිළිබඳ චිත්‍රයක් ඔහු ලබා දෙයි. එය ඉතා බලවත් සංවිධානයක් වී ය. ඔවුන්ට සමාජවාදී තුනෙන් එක් කොටසක් ඔවුන්අත පැතුණි. ඉතාලියේ ඉතා ම වැදගත් කොටස්, කම්කරුවන්ගේ බලකේන්ද්‍ර, සමාජවාදීන් අත තිබුණි. රැකියාවකට ගැනීම හෝ ඉන් නෙරපා හැරීම, වෘත්තීය සමිතියේ අවසරය නොමැතිව කිරීමට කිසිදු කම්කරුවන් සම්බන්ධයෙන් ද අදාළ වූ තත්ත්වයකි. එය නිර්ධන පන්ති ආඥාදායකත්වයෙන් සියයට 49 ක් වී යැයි පෙනෙන්නට තිබුණි. එහෙත් මේ තත්ත්වය කෙරෙහි සුලු ධනපතියන්ගේ, විසුරුවා හරිනු ලැබ සිටි හමුදා නිලධරයන්ගේ විරුද්ධත්වය රුදුරු විය. හමුදා නිලධාරීන්ගේ මෙහෙයුම යටතේ ඔවුන් කුඩා කණ්ඩායම් සංවිධානය කොට සෑම දිසාවකටම බස් රථවලින් පිටත් කර යැවූ සැටි කතුවරයා පෙන්වා දෙයි. සමාජවාදීන් අත පැවති දස දහස් ගණන් ජන සංඛ්‍යාවකින් පෙන්වා දෙයි. සමාජවාදීන් අත පැවති දස දහස් ගණන් ජන සංඛ්‍යාවකින් යුත් නගරවලට පිවිසි සංවිධිත තිස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් නාගරික ගොඩනැගිලි, නිවාස ගිනි තබමින් නායකයන්ට වෙඩි තබා ඔවුන් මත ධනපතියන් උදෙසා වැඩ කිරීමේ කොන්දේසි පැටවූහ. ඉනික්බිතිව වෙනත් තැන්වලට ද ගිය ඔවුහු එකකට පසු එකක බැගින් සිය ගණන් නගරවල එය ම සිදු කළහ. මෙම ක්‍රමානුකූලත්‍රස්ත ක්‍රියා මගින් වෘත්තිය සමිති සහමුලින් විනාශ කළ ඔවුහු ඉතාලියේ බලධාරීන් බවට පත් වූහ. ඔවුහු කුඩා සුලුතරයක් වූහ.

කම්කරුවෝ ජෙනරාල් ස්ට්‍රයිකයක් ප්‍රකාශයට පත් කළහ. තම බස් රථ පිටත් කර යැවූ ෆැසිස්ට්වාදියෝ සෑම ප්‍රාදේශිය ස්ට්‍රයිකයක් ම බිඳලූහ. සංවිධාන අතු ගා දැමූහ. මෙයින් පසු මැතිවරණ එළඹුණි. ත්‍රස්තය යටතේ කම්කරුවෝ පෙර සමාන ම නියෝජිත සංඛ්‍යාවක් තෝරා පත් කළහ. පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් ම නියෝජිතයෝ එය තුළ විරෝධය පළ කර ගෙන ගියහ. ආකාරගත බලය හා නත්‍ය බලය අතර වෙනස එය යි. තමන් ට බලය ලැබෙනු ඇතැයි සියලු පාර්ලිමේන්තු සූදානමකින් යුත්‍, මෙම දැවැන්ත ව්‍යාපාරය කැප වීමේ ජීවයකින්‍ක්තව හා හොඳ මිලිටරි ෆැසිස්ට්වාදීන් විසින් බිඳ හෙළනු කුඩු කරනු හා අහෝසි කරනු ලැබුණි.

ඇමරිකාවේ දී තත්වය වෙනස් විය හැකි නමුත් මූලික කර්තව්‍යයන් සමාන වේ. ගේග්ගේ උපායන් ගැන මම කියවූයෙමි. එය ෆැසිස්ට්වාදී බලය පැහැර ගැනීමක පෙරහුරුවකි. අර්බුධය උග්‍ර වීම නිසා කෝපාවිෂ්ට වී සිටින, සුලු හාම්පුතුන්, ඔහු විසින් නියෝජනය කෙරේ. මුළුමනින් ව්‍යවස්ථා විරෝධී වන මැර බළඇණියක් ඔහු සතු ය. මෙය අතිශයින් බෝ වනසුලු ය. අර්බුදයේ ගැඹුරු වීම සමඟ එය රට පුරා පැතිර යනු ඇත. ඉතා හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වන රූස්වෙල්ට් එවිට දී කියනු ඇත්තේ "ඇතැම් විට, එක ම විසඳුම මෙය වන්නේ ය" යනුවෙනි.

ඉතාලියේ ද එය එසේ ම විය. සමාජවාදීන් ට ආරාධනා කළ ඇමතිවරයෙක් එහි සිටියේ ය. සමාජවාදියෝ එය ප්‍රතික්ෂේප කළහ. එවිට ඔහු ෆැසිස්ට්වාදීන් ඇතුළත් කර ගත්තේ ය. ඔහු කල්පනා කළේ සමාජවාදීන්ට විරුද්ධව ෆැසිස්ට්වාදීන් යොදා ගෙන තුලනය කිරිමට ඔහුට හැකි වෙතැයි යන්න ය. එහෙත් ඔවුහු ඇමතියා ද කුඩු කර දැමුහ. නිව් ජර්සිවල උදාහරය ඉතා වැදගත් ය යි මම සිතමි. සියල්ලක් ම, විශේෂයෙන් ම මෙය, අප විසින් උපයෝගි කර ගත යුතු ය. ෆැසිස්ට්වාදීන් ජයග්‍රාහී වූයේ කෙසේ ද යන්න ගැන විශේෂ ලිපි මාලාවක් මම යෝජනා කරමි. එපරිද්දෙන් ම අපට ද ජයග්‍රාහී විය හැකි ය. එහෙත් අපට දැවැන්ත කම්කරු සමූහයාගේ සහයෝගය සහිත කුඩා සන්නද්ධ බලකායක් සිටිය යුතු ය. හොඳින් ම විනයගත හා සංවිධිත කම්කරුවන්, ආරක්ෂක කම්ටු අපට තිබිය යුතු ය. නැත හොත් අපව මුදල් ගෙවීමට පමණි. අනෙක් කර්තව්‍යයන් සඳහා කිසිදු සූදානමක් නො වීය. හිට්ලර් මීට ප්‍රතිවිරෝධී ලෙස අපෙන් අපේක්ෂා කළ දේ දැන් අප විසින් කළ යුතු වේ. රැස්වීම විසුරුවා හැරිම සඳහා හතළිස් පනහක් දෙනා යැවීම මෙය අතිශය වැදගත්කමක් දරයි. කම්කරුවෝ අයෝමය සටන්කාමී කොටසක් බවට පත් වේ. ඔවුහු හොරණෑවක් බවට පත් වෙති. මොවුන් බැරෑරුම් ජනයා බව සුලු ධනේශ්වරය සැලකිල්ලට ගනී. ඒ තරම් සාර්ථකත්වයක් මෙය ඉතා දැවැන්ත ලෙස වැදගත් ය. ජනගහනයෙන් එතරම් විශාල කොටසක් අන්ධ, පසුගාමී හා පීඩිත වන හෙයින් ඔවුන් නැගිටුවා ගත හැකි වන්නේ පෙරමුණු බළඇණිය පමණි. එහෙත් මේ පෙරමුණු බළඇණිය විසින් අන්අය නැගිටුවා ගත යුතු ය. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයකැයි මා නැවතත් පුනරුච්චාරණය කරන්නේ එහෙයිනි. ඉතා පුහුණු බලගතු සහෝදරවරුන් සිටින මිනියාපොලිස්වලින් පටන් ගෙන අපට මෙය මුළු රටට පෙන්නුම් කළ හැකිය.

අපේ පිටපතෙහි ඇති තරම් වර්ධනය කර ඇති කෙටුම්පත් වැඩ පිළිවෙළේ මේ කොටස තරමක් සාකච්ඡා කිරිම ප්‍රයෝජනවත් වේ යැයි මම විශ්වාස කරමි. එය පොදු න්‍යායික කොටසයි. ඉහත සාකච්ඡාවේ දී මා සඳහන් කළේ සමාජය පිළිබඳ පොදු විශ්ලේෂණයක් වශයෙන් ක්‍රියා මාර්ගයේ න්‍යායික කොටස, මේ කෙටුම්පතේ දී පරිපූර්ණව ඉදිරිපත් කර නැති බවත් එය කෙටි ඇඟවීම් කීපයකින් විස්ථාපනය කෙරී ඇතිබවත් ය. අනෙක් අතට විප්ලවය, කම්කරු පන්ති ආඥාදායකත්වය හා විප්ලවයෙන් පසුව සමාජය ගොඩ නැගීම පිළිබඳව කොටස් ඊට ඇතුළත් නැත. අදාළ ලෙස ගෙන ඇත්තේ සංක්‍රමණ අවධිය පමණි. අපේ ක්‍රියාකාරීක්වයේ විද්‍යාත්මක ස්වාභාවය සමන්වත වන්නේ අප අපේ ක්‍රියා ා‍ර්ගය අනුගත කරන්නේ, සමාජයේ ආර්ථික පන්ති ව්‍යුහය විසින් නියෝජනය කෙරෙන වෛෂයික තත්වයට මිස, දේශපාලන තත්වානුකූල භාවයන්ට හෝ අද පවතින

ස්වරූපයෙන් මහජන චින්තනයට හා මනෝගතීන්ට හෝ නො වන්නේ ය යන සාධකය මත බව අප විසින් බොහෝ විට ප්‍රකාශ කෙරී ඇත. මනෝගතිය පසුගාමී විය හැකි ය. එවිට දී පක්ෂයේ කර්තව්‍යය වන්නේ වෛෂයික කර්තව්‍ය කම්කරුවන්ගේ පසුගාමී මනෝගතියට අනුගත කළ නොහැකි ය. මානසික තත්ත්වය හෝ මනෝගතිය ද්විතීය සාධකයකි. ප්‍රාථමික සාධකය වන්නේ වෛෂයික තත්ත්වය යි. ක්‍රියා මාර්ගයේ ඇතැම් කොටස් තත්ත්වයට නොගැලපෙන්නේ ය යන මේ විවේචන හෝ තක්සේරු කිරීම් අපට අසන්ට ලැබෙන්නේ මේ නිසා ය.

හැම තැනක දී ම මම මෙසේ ප්‍රශ්න කරමි. අප කළ යුත්තේ කුමක් ද? අපේ ක්‍රියා මාර්ගය, වෛෂයික තත්ත්වයට ගැළපෙන සේ සකසනවා ද? නැති නම් මාර්ගය ඇමරිකානු තත්ත්වයට සුදුසු නොවෙතැයි කියන හැම සහෝදරයෙකු හමුවේ ම මේ ප්‍රශ්නය තැබිය යුතු ය යි මම විශ්වාස කරමි. මේ ක්‍රියා මාර්ගය විද්‍යාත්මක ක්‍රියා මාර්ගයකි. එය පදනම් කෙරී ඇත්තේ වෛෂයික තත්වය පිළිබඳ වෛෂයික විශ්ලේෂණයක් මත ය. එය සමස්තයක් වශයෙන් කම්කරුවන්ට අවබෝධ කළ නොහැකි ය. ඊළඟ කාල පරිච්ඡේදයේ දී කම්කරු පන්තියේ පෙරමුණු බළඇණිය එය අවබෝධ කර ගත හොත් හා ඉනික්බිතිව ඔවුන් කම්කරුවන් වෙතට හැරී "ඔබ ෆැසිස්ට්වාදයෙන් ආරක්ෂා විය යුතුය." යි කියතොත් එය ඉතා හොඳ වෙයි.

වෛෂික තත්ත්වය යනුවෙන් අපි කුමක් තේරුම් ගනිමු ද? මෙහි දී අප විසින් සමාජ විප්ලවයක් සඳහා වෛෂයික කොන්දේසි දක්වා ඇති මේ කොන්දේසි සාරාර්ථ වශයෙන් ද අද දු නො වෙනස්ව පවතී. පළමුව, මාක්ස් එක් වතාවක දී ප්‍රකාශ කළේ, කවර සමාජයක් වත් එහි සක්‍යතා මුළුමනින් ක්ෂය වන තුරු එහි තැන අත හැර නොයන බව යි. මෙයින් අර්ථවත් වන්නේ කුමක් ද? අපට මනෝබද්ධ අධිෂ්ඨාය මගින් සමාජයක් අතුගා දැමිය නො හැකි බව යි.අපට බ්ලැන්කිවාදීන් මෙන් සන්නද්ධ නැගිටීමක් සංවිධානය කළ නො හැකි බවයි. "සක්‍යතා" යනුවෙන් අදහස් වන්නේ කුමක 'ද? "සමාජයකට සිය තැන අත හැර දා යා නො හැකි ය" යන්නෙන්? නිෂ්පාදන බලවේග වර්ධනය කරමින් ජාතිය පොහොසත් කිරීමට යම් සමාජයක් සමත් වන තාක් කල් එය ශක්තිමත් හා ස්ථාවරව පවතී. වහල් සමාජය, වැඩ වසම් හා ධනේශ්වර සමාජය සම්බන්ධයෙන් තත්වය වූයේ එය යි.

මා මීට ඉහත දී කොමියුනිස්ට් ප්‍රකාශනයට ලියූ පෙරවදනෙහි විශ්ලේෂණය කළ ඉතා වැදගත් කරුණක් කරා මෙහි දී අපි එළඹෙන්නෙමු. මාක්ස් හා එංගල්ස්, ඔවුන්ගේ ජීවිත කාලය තුළ දී විප්ලවයක් අපේක්ෂාවෙන් සිටියහ. විශේෂයෙන් 1848 - 50 වසරවල දී පදනම්ූ ධනවාදී ක්‍රමය, නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයට තිරිංගයක් වී ඇතැයි ඔවුහු කියා සිටියහ. මෙය නිවැරදි ද? ඔව් සහ නැත. දහනව වන සියවසේ අවශ්‍යාවන්ට උර දී බලය ගැනීමට කම්කරුවන් සමත් වූයේ නම් නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය වඩාත් වේගවත් වී ජාතිය වඩාත් පොහොසත් විය හැකි වි ය යන අර්ථයෙන් එය නිවැරදි ය. එහෙත් කම්කරුවන් ඊට අසමත් වීමේ තතු යටතේ ධනේශ්වර ක්‍රමය එහි අර්බුධ යනාදිය සහිතව පැවති ගෙන ගියේ ය. ඒ වුව ද පොදු රේඛාව ඉහළ නැගුණේ ය. පසු ගිය (1914 - 18) යුද්ධය වනාහි නිෂ්පාදන බලවේගවල වර්ධනයට නො ගැළපෙන තරම් ලෝක

වෙළඳ පොළ පටු වීමේ ද, එක් එක් ජාතිය, අනෙකුත් ජාතීන පලව ාහැර තමන්ගේ අරමුණු සඳහා ලෝක වෙළඳ පොළ අල්ලා ගැනීමට ප්‍රයත්න දැරීමේ ද ප්‍රතිඵලයක් වී ය. ඔවුන්ට සාර්ථක විය නොහැකි වුයෙන් ධනවාදී සමාජය දැන් නව අවධියකට ඇතුළු වනු අපට දැකිය හැකි ය.

බොහෝ දෙනා කියන්නේ මෙය යුද්ධයේ ප්‍රතිඵලයක් බව යි. එහෙත් යුද්ධය වනාහි සමාජය සිය ඉඩකඩ ක්ෂය කර ගනු ලැබීමේ ප්‍රතිඵලයකි. ඊට තව දුරටත් ව්‍යාප්ත විය නොහැ කි වීමේ ප්‍රකාශයක් පමණි. යුද්ධය. ඓතිහාසික අර්බුදය, යුද්ධයට පසු ගැඹුරින් ගැඹුරට සේන්දු විය. සියලු තන්හි ධනේශ්වර වර්ධනය සමෘද්ධිය හා අර්බුධය වශයෙන් පැවති අතර අර්බුධවල හා සමෘද්ධීන්හි කූට ප්‍රාප්තිය නැගීමක් ලෙස පැවතුණි. යුද්ධයේ ආරම්භයත් සමග අප දකින්නේ, අර්බුද්යන්ගේ හා සමෘද්ධීන්ගේ වක්‍ර මගින් බැසීම් රේඛාවක් දැක්වීම ය. එයින් පෙන්නුම් කෙරෙන්නේ, දැන් මෙම සමාජය තම සියලු අභ්‍යන්තර සක්‍යතා ක්ෂය කර ගෙන ඇති බවත් නව සමාජයක් මගින් විස්ථාපනය විය යුතු හෝ එසේ නො වූයේ නම් තම සක්‍යතා ක්ෂය වූ තතු යටතේ එය විස්ථාපනය කිරීම සඳහා පන්තියක් නොපැවතීමේ හේතුවෙන් ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරයන් ඇද වැටුණාක් මෙන් පැරණි සමාජය ම්ලේච්ඡත්වය කරා එළඹෙනු ඇති බවත් ය.

දැන් පවතින ප්‍රශ්නය - විශේෂයෙන් ඇමරිකාවේ - එය යි. නව සමාජයක් සඳහා දැන් අවශ්‍ය වන ප්‍රථම කොන්දේසිය නම්, වඩා ඉහළ සමාජ ක්‍රමයක් සඳහා උපත ලබා දීමට සෑහෙන තරම් නිෂ්පාදන බලවේග වඝ්ධනය වී පැවතීම ය. මේ සඳහා නිෂ්පාදන බලවේග සෑහෙන තරම් වර්ධනය වී පවතී ද? දැන් තරම් හොඳින් නුවුණත්, සෑහෙන තරමින් ඒවා දහනව වන සියවසේ දී ම වර්ධනය වී පැවතුණි. ඇමරිකාවේ නිෂ්පාදන බලවේග දැන්මුදා හරිනු ලැබුව හොත් ඒවා දෙගුණ තෙගුණ කළ හැකි වන බව හොඳ සංඛ්‍යා ලේඛනඥයෙකුට විශේෂයෙන් ම ඇමරිකාවේ දී ඔප්පු කර පෙන්වීම ඉතා පහසු වනු ඇත. අපේ සහෝදරවරුන් එවැනි සංඛ්‍යා ලේඛනම පර්ශේෂණයක් කළ යුතු වේ යැයි මම විශ්වාස කරමි.

දෙවන කොන්දේසිය - සමාජය මත සිය අධිෂ්ඨානය පැළපදියම් කළ හැකි තරමින් සංඛ්‍යාත්මක විශාලත්වයකින් යුත් හා ආර්ථික බලපෑමකින් යුත් නව ප්‍රගතිශීලී පන්තියක් සිටිය යුතු ය. මේ පන්තිය නම් කම්කරු පන්තිය යි. එය ජාතියේ බහුතරය හෝ බහුතරයට නායකත්වය දීමේ සක්‍යතාව සහිත හෝ විය යුතු ය. එංගලන්තයේ දී කම්කරු පන්තිය පරම වශයෙන් ම බහුතරය වෙයි. රුසියාවේ දී සුලුතරයක් වුව ද එය දුගී ගොවීන් මෙහෙයවා ගැනීමේ ශක්තියෙන් යුක්ත වීය. ඇමරිකාවේ දී එය යටත් පිරිසෙයින් ජනගහන්යෙන් අඩක් වුවත් ගොවීන් මෙහෙයවා ගැනීමේ ප්‍රස්තාව ඊට පවතී.

තුන් වන කොන්දේසිය වන්නේ මනෝබද්ධ සාධකය යි. මේ පන්තිය, සමාජය තුළ තමන් දරන තැන අවබෝධ කර ගෙන තමන්ගේ ම සංවිධාන පවත්වා ගත යුතු ය. ඓතිහාසික දෘෂ්ටි ආස්ථානයක සිට සලකන කල දැන් නො පවතින්නේ එම කොන්දේසිය යි. සමාජයීය වශයෙන් එය

සක්‍යතා සහිත වනවා පමණක් නොව පරම අවශ්‍යතාවක් ද වෙයි.  ඒ එක්කො සමාජවාදය නැති නම් මිලේච්ඡත්වය යන අර්ථයෙනි. ඓතිහාසික විකල්පයන් ඒවාය.

හේග් මහතා, තමාගේ නගරයෙහි ඇතැම් මධ්‍ය කාලීන ක්‍රමයක් පවතින්නේ යැයි කල්පනා කරන තකතීරු නාකියෙකු නොවන බව අපි සාකච්ඡාවේ දී සඳහන් කළෙම.

ජැක් ලන්ඩන් "අයෝමය විළුඹ" යන නමින් පොතක් ලිවී ය. මම දැන් එය නිර්දේශ කරමි. එය ලියන ලද්දේ 1907 දී ය. එවක දී එය බියකරු සිහියක් කොට සලකන ලද නමුත් අද එය පරම යථාර්ථය වෙයි. ධනපති පන්තිය  විසින් කුරිරු මර්ධනයක් මගින්

දෙවන කොන්දේසිය - සමාජය මත සිය අධිස්ථානය පැළපදියම් කළ හැකි තරමින් සංඛ්‍යාත්මක විශාලත්වයකින් යුත් හා ආර්ථීක බලපෑමකින් යුත් නව ප්‍රගතිශීලී පන්තියක් සිටිය යුතු ය. මේ පන්තිය නම් කම්කරු පන්තිය යි. එය ජාතියේ බහුතරය හෝ බහුතරයට නායකත්වය දීමේ සක්‍යතාව සහිත  හෝ විය යුතු ය. එංගලන්තයේ  දී කම්කරු පන්තිය පරම වශයෙන් ම බහුතරය වෙයි. රුසියාවේ දී සුලුතරයක් වුව ද එය දුගී ගොවීන් මෙහෙයවා ගැනීමේ ශක්තියෙන් යුක්ත වී ය. ඇමරිකවේ දී  එය යටත් පිරිසෙයින් ජනගහනයෙන් අඩක් වුවත් ගොවීන් මෙහෙයවා ගැනීමේ ප්‍රස්ථාව ඊට පවතී.

තුන් වන කොන්දේසිය වන්නේ මනෝබද්ධ සාධකය යි. මේ පන්තිය, සමාජය තුළ තමන් දරන තැන අවබෝධ කර ගනෙ තමන්ගේ ම සංවිධාන පවත්වා ගත යුතු ය. ඓතිහාසික දෘෂ්ටි ආස්ථානයක සිට සලකන කල දැන් නොපවතින්නේ එම කොන්දේසියයි. සමාජීය වශයෙන් එය සක්‍යතා සහිත වනවා පමණක් නොව පරම අවශ්‍යතාවක් ද වෙයි. ඒ එක්කෝ සමාජවාදය නැති නම් මිලේච්ඡත්වය යන අර්තයෙනි. ඓතිහාසික විකල්පයන් ඒවා ය.

හේග් මහතා, තමාගේ නගරයෙහි ඇතැම් මධ්‍යකාලීන ක්‍රමයක් පවතින්නේ යැයි කල්පනා කරන තකතීරු නාකියෙකු නොවන බව අපි සාකච්ඡාවේ දී සඳහන් කළෙමු.

ජැක් ලන්ඩන් "අයෝමය විළුඹ" යන නමින් පොතක් ලිවී ය. මම දැන් එය නිර්දේශ කරමි. එය ලියන ලද්දේ 1907 දී ය. එවක දී එය බියකරු සිහිනයක් කොට සලකන ලද නමුත් අද එය පරම යථාර්ථය වෙයි. ධනපති පන්තිය ඇමරිකාවේ පන්ති අරගලයෙහි වර්ධනය, ඔහු එහි දක්වයි. එය ෆැසිස්ට්වාදය පිළිබඳ චිත්‍රයකි. ඔහු මතු කරන දෘෂ්ටිවාදය හිට්ලර්ට පවා සමාන ය. එය වැදගත් ය.

හේග් අනුකරණය කිරීමට නිවෝර්ක්හි නගරාධිපතියා පටන් ගනී. ඔවුන් සියල්ලෝ ම හේග්ගේන් හා මහ ධනපතියන්ගේන් ආස්වාදය ලබති. දැන් අර්බුදයේ දී ප්‍රජාතන්ත්‍රීය ක්‍රමවලින් තමාට කිසිවක් කළ නොහැකි යයි රූස්වෙල්ට් නිරීක්ෂණය කරනු ඇති බව පරම වශයෙන් සහතික ය. ස්ටැලින්වාදීන් 1932 දී කියා සිටියාක් මෙන් ඔහු ෆැසිස්ට්වාදියෙක් නොවේ. එහෙත් ඔහුගේ ආරම්භකත්වයන් පක්ෂාඝාත කෙරෙනු ඇත. ඔහුට කුමක් කළ හැකි ද? කම්කරුවෝ අතෘප්තියට පත්ව සිටිති. විශාල හාම්පුත්තු අතෘප්තව සිටිති.ඔහුගේනිල කාලය අවසානය තෙක් උපමාරු යෙදීමෙන් පසුව ඔහු සමු ගත යුතුය. තුන් වන වාරයක් රූස්වෙල්ට් හට ලැබීම කිසි සේත් සිදු විය නොහැකි ය.

නිවෝර්ක් නගරාධිපතියා විසින් හේග් අනුකරණය කිරීම දැවැන්ත වැදගත්කමක් දරයි. ඇමරිකානු ස්වරූපයේ බලගතු ෆැසිස්ට් ව්‍යාපාරයක් අවුරුදු දෙකනකින් ඔබට හමුවිය හැකි ය. හේග්කව්ද? හිට්ලර් හා මුසෝලිනි සමග කිසිදු සම්බන්ධයක් නැතත් ඔහු ඇමරිකානු ෆැසිස්ට්වාදියෙකි. ඔහු උසිගැන්වී සිටින්නේ ඇයි? සමාජය ව දුරටත් ප්‍රජාතන්ත්‍රීය ක්‍රමයන්ගෙන් පවත්වා ගෙන යා නොහැකි නිසාය.

උන්මාදනීයත්වයට පත් වීමට කිසිදු අවසරයක් නිසැකව ම නැත. කම්කරු පන්තිය ඉක්මවා සිද්ධිදාමය ගමන් කිරීමට ඉඩ තිබීමේ අන්තරාය අවිවාදාත්මක ය. එහෙත් අපට මේ අනතුර සමග පොර බැදිය හැක්කේ, අපේ ම ඔලුවලට උඩින් පැනීමේ ව්‍යාජ උත්සාහයන් මගින් නොව, පිරිමසන විප්ලවවාදී සටන් පාඨ යටතේ අපේ ම ක්‍රියාකාරීත්වය ශක්තියමත්ව හා ක්‍රමානුකූලව වර්ධනය කිරීම මගින් පමණි.

ප්‍රජාතන්ත්‍රවාදය, විශාල හාම්පුතුන්ගේ පාලනයයි. ඇමරිකාව පාලනය කෙරෙන්නේ පවුල් හැටක් විසිනැයි ලන්ඩ්බර්ග් සිය කෘතියෙහිලා පෙන්වා දුන් දේ අප හොඳින් අවබෝධ කළ යුතු ය. එහෙත් ඒ කෙසේ ද? අද වන තෙක් ම ප්‍රජාතන්ත්‍රීය ක්‍රමවලිනි. ඔවුහු, මධ්‍යම පන්තීන්, සුලු ධනේශ්වරය හා කම්කරුවන් විසින් වට කර ගනු ලැබ සිටින කුඩා සුලුතරයක් වෙති. මේ සමාජය කෙරෙහි මධ්‍යම පන්තීන් උනන්දු කරවනු වස් ප්‍රස්ථාවන් ඔවුන් සතු විය යුතු ය. ඔවුන් මංමුළාවට පත් නොවිය යුතු ය. කම්කරුවන් සම්බන්ධයෙන් ද එය එපමණට ම අදාළ වේ. අඩු තරමින් ඉහළ ස්ථරයන් සම්බන්ධයෙන් වත් ඔවුන් විරුද්ධ වුයේ නම් ඔවුන්ට පහළ ස්ථරයන්ගෙන් විප්ලවවාදී සක්‍යතා ඇවිස්සිය හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරවනු හැක්කේ ඒ ආකාරයෙන් පමණි.

ප්‍රජාතන්ත්‍රවාදී තන්ත්‍රය පාලන ක්‍රම අතුරින් ඉතා ම ප්‍රභූතන්ත්‍රීය ක්‍රමයයි. එය කළ හැක්කේ පොහොසත් ජාතියකටපමණි. හැම බ්‍රිතාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදියෙකුට ම යටත් විජිතවල වැඩ කරන නවයක් හෝ දහයක් වහල්ලු සිටිති. ආවීර්ණකල්පික ග්‍රීක සමාජය, වහල් ප්‍රජාතන්ත්‍රයක් වී ය.

බ්‍රිතාන්‍ය, ඕලන්ද, ප්‍රන්ස හා බෙල්ජියානු ප්‍රජාතන්ත්‍රයන් සම්බන්ධයෙන් ද එක් අර්ථයකින් එය ම කිව හැකි ය. ඇමරිකාවට කෙලින් ම තමන් සතු යටත් විජිත නැත. එහේ එයට ලතින් ඇමරිකාව තිබෙන අතර, සමස්ත ලෝකය ම, ඇමරිකාවට යටත් විජිතයක් වැනි ය. ඒ පොහොසත් ම මහාද්වීපය අත්පත් කරගෙන සිටීම හා වැඩවසම් සම්ප්‍රදායකින් තොරව වර්ධනය වීමට අමතර වශයෙනි. එය ඓතිහාසික වශයෙන් වරප්‍රසාදිත ජාතියකි. එහෙත් වරප්‍රසාදිත ධනපති ජාතීන් ඉතාම "අධම" ධනපති ජාතීන්ගෙන් වෙනස් වන්නේ, පමාව පිළිබඳ කරුණින් පමණි. මහා ධනපති ජාතීන් අතරින් දුප්පත් ම ජාතිය වූ ඉතාලිය ප්‍රථමයෙන් ම ෆැසිස්ට්වාදී විය. දෙවනුව ජර්මනිය එසේ වූයේ එරටට යටත් විජිත හෝ පොහොසත් අනුපූරක රටවල් හෝ නොමැති වීම නිසා පැවති දරිද්‍ර පදනම ත සියලු සක්‍යතා ක්ෂයට ගිය හෙයිනි. එමෙන්ම කම්කරුවන්ට ධනපති පන්තිය විස්ථාපනය කළ නො හැකි වූ නිසා ය. දැන් ඇතැම් විට මහා බ්‍රිතාන්‍යට හා ප්‍රන්සයට පෙරාතුව පවා - ඇමරිකාවේ වරායයි.

අප පක්ෂයේ යුතුකම වන්නේ හැම ඇමරිකානු කම්කරුවෙකු ම අල්ලා ඇමරිකාවේ පවතන තත්ත්වය කුමක් දැයි ඔහුට අවබෝධ වන අයුරු දස වරක් ඔහු සොලවාලීම යි. එනම්, මෙය තත්වානුගත අර්බුධයක් නොවේ ය. සමාජ අර්බුධයක් ය යන්න අපේ පක්ෂයට දැවැන්ත කාර්යභාරයක් ඉටු කළ හැකිය. පූර්ව සම්ප්‍රදායන්ගේ, කුහකත්වයේ, ළන වාතාවරණයක් තුළ සිටින තුරුණු පක්ෂයකට අසීරු වන්නේ විප්ලවවාදී සටන් පාඨයක් දියත් කිරිම ය. "මෙය පුදුමාකාරය" " ඇමරිකාවට නො සෑහේ" එහෙත් ඔබ ඔබේ ක්‍රියා මාර්ගයේ විප්ලවවාදී සටන් පාඨ දියත් කරන කාලය වන විට දී මෙය වෙනස් වීමට ඉඩ තිබේ. ඇතැමෙක් සිනාසෙනු ඇත. එහෙත් විප්ලවවාදී ධෛර්යසම්පන්න භාවය වන්නේ වෙඩි කෑම පමණක් නොව. වැඩිතරය ලෙස සිටින තකතීරු ජනයාගේ සිනහව ද දරා සිටීමය. එහෙත් හේග්ගේ මැර කල්ලිය විසින් ඉන් එකෙකුට පහර දෙනු ලැබූ විට, ආරක්ෂක කමිටුවක් හදා ගැනීම හොඳ යයි ඔහු සිතනු ඇත. ඔහුගේ උත්ප්‍රාසාත්මක ආකල්පය වෙනස් වනු ඇත.

ප්‍රශ්නය : කම්කරුවන්ගේ දෘෂ්ටිවාදය, වෛෂයික සාධකවල කොටසක් නො වන්නේ ද?

ට්‍රොට්ස්කි කුඩා අඩු කණ්ඩායමක් වශනේ ගත් කල අපට, කම්කරුවන්ගේ මනෝගතිය ද ඇතුළුව මේ සියල්ල වෛෂික ය. එහෙත්, වෛෂයික තත්ත්වෙහිලා අපේ පත්‍රයමගින් වෙනස් කළ හැකි හා වෙනස් කළ නොහැකි වූ මූලිකාංගඅප විසින් විශ්ලේෂණය හා වර්ගීකරණය කළ යුතු ය. ක්‍රියාමාර්ගය, වෛෂික තත්වයෙහි මූලික හා ස්ථාවර මූලිකාංගවලට අනුගත කොට ඇති බවත් කර්තව්‍යය වන්නේ මහජනයාගේ මානසික තත්ත්වය එම වෛෂයික සාධකවලට අනුගත කිරිම බවත් අප කියන්නේ එහෙයිනි. මානසික තත්ත්වය අනුගත කිරිම ශික්ෂණය පිළිබඳ කර්තව්‍යයකි. අප ඉවසිලිවත් විය යුතුය. අපේ ක්‍රියාකාරීත්වයෙහි පදනම ලෙස සැපයී ඇත්ගේ සමාජයේ අර්බුධය යි. අප එය වෙනස් කළ යුතු ය. සමාජය පිළිබඳ විද්‍යාත්මක විවරණයක් අප විසින් සම්පාදනය කළ යුතු අතර එය පැහැදිලි ලෙස මහජනයාට විස්තර කළ යුතු ය. මාක්ස්වාදය හා ප්‍රතිසංස්කරණවාදය අතර වෙනස එය යි.

ශ්‍රාවකයන්ට අවශ්‍ය දේ ගැන හොඳ ඉවක් ප්‍රතිසංස්කරණවාදීන්ට පවතී. නෝර්මන් තෝමස් ඔවුන්ට ලබා දෙන දේවල් මෙනි. එහෙත් ඒ බැරෑරුම් විප්ලවවාදී කටයුතු නො වන්නේය. ජනප්‍රිය නො වීමට, "ඔබ මෝඩයන් ය," "ඔබ තකතීරුවන් ය," "ඔවුන් ඔබ පාවා දෙන්නේ ය" කියා සිටීමට අපට ධෛර්යය තිබිය යුතු ය. ඇතැම් විට දී අප නිදහස් බලගතු හැඟීමකින් යුතුව දියත් කිරීමට අප ධෛර්යවත් විය යුතුය. පැහැදිලි කිරීම් සඳහා කම්කරුවන් විටින් විට සොලවාලීම අවශ්‍ය ය. යළිදු වරක් හු සොලවාලිය යුතු ය. ඒ සියල්ල අයත් වන්නේ ප්‍රචාරය පිළිබඳ කලාවට ය. එහෙත් එය මහජනයාගේ මනෝගතියට නැමී ගෙන කරන්නක් නොව විද්‍යාත්මක විය යුතු ය. ඉතා ම යථාර්ථත් ජනයා අප වන්නේ නෝර්මන් තොමස්ගේ වාගාලාපවලින් වෙනස් කළ නොහැකි සාදක අප සලකිල්ලට ගන්නා හෙයිනි. අප ක්ෂණික ජයග්‍රහණ ලබා ගන්නේ නම් අප පිහිනන්නේ දියවැල් සමග ය. එම දියවැල විප්ලවය යි.

ප්‍රශ්නය : අපේ ම නායකයන් ට මේප්‍රශ්න හැඟී ගොස් නැතැයි සමහර විට මම සිතමි.

ට්‍රොට්ස්කි : බොහෝ විට ඒ දෙකරුණකි. එකක් අවබෝධ කර ගැනීමය, අනෙක මස්පිඬු හා ස්නායු පද්ධතිය මගින් හැඟීම ය. අපේ දේශපාලනය වෙනස් කළ යුතු ය යන මේ අවබෝධයෙන් විනිවිදිනු ලැබීම දැන්අවශ්‍ය වන්නේ ය. එය මහජනයා කෙරෙහි බලපාන ප්‍රශ්නයක් පමණක් නොව පක්ෂය කෙරෙහි ම ද බලපාන්නකි. එය පක්ෂය කෙරෙහි බලපාන ප්‍රශ්නයක් පමණක් නොව නායකයන් කෙරෙහි ද බලපාන්නකි. අප ඇතැම් විට දී එක ම ආස්ථානය කරා ඒම කළ නො හැක්කකි. හැම විට ම ඝර්ෂණයන්පවතී. ඒවා නො වැළැක්විය හැකි වා පමණක් නො ව අවශ්‍ය ද වන්නේ ය. මේ ක්‍රියා මාර්ගයට හේතුව, මේ සාකච්ඡාව මතු කර ැනීමට හේතුව එයයි.

ප්‍රශ්නය : නායකයන් අතර මේසාකච්ඡාව සඳහා අපි කොතෙක් කාලයක් වෙන් කරමු ද?

ට්‍රෙට්ස්කි : එය කීම අපහසු ය. එය බොහෝ සාදක මත රැඳී පවතී. ඉතා දිගු කාලයක් ලබා දීමට අට නො හැකි ය. අප දැන් මෙම නව නැඹුරුව සම්පූර්ණ කළ යුතු ය. එය නවතම හා පැරණි වේ. සියලු අතීත ක්‍රියාකාරීත්වය මත පදනම් කෙරී ඇති අතර දැන් එයින් අලුත් පරිච්ඡේදයක් විවෘත කෙරෙයි. අපි අපේ සියලු බලවේග වඩා ජවසම්පන්න ආකල්පයකින් යුතුව ඒ මත බළ මුළු ගැන්වීය යුතු ය. ක්‍රියා මාර්ගය ස්ථිර වශයෙන් තහවුරු කර ගැනුණු විට දී වැදගත් වන්නේ, රටේ හැම කොටසකට ම, හැම දෙනා ම, එකම විට දී එක ම සටන් පාඨ පාවිච්චියට ගන්නා අයුරින් සටන් පාඨ ඉතා හොඳින් දැන සිටීමත් ඒවා දක්ෂ ලෙස හැසිරවීමත් ය. එවිට දී තුන් දහසක් දෙනාට, පහළොස් දහසකගේ හෝ පනස් දහසකගේ බලපෑමක් ඇති කළ හැකි ය.

ප්‍රශ්නය : සහෝදරවරුන් වියුක්ත ලෙස මෙම ක්‍රියා මාර්ගයට එකඟ විය හැකි ය. එහෙත් මහජනයා අතරට සටන් පාඨ ගෙන යාම සඳහා අත්දැකීම් සහිත සහෝදරවරුන් අපට සිටත් ද?

ඔවුන් වියුක්තව එකඟ වෙතත්, මගේ වෘත්තිය සමිතියේ පසුගාමී කම්කරුවන් සම්බන්ධයෙන් මට කළ හැක්කේ කුමක් ද?

ට්‍රොට්ස්කි: අපේ පක්ෂය ඇමරිකානු කම්කරු පන්තියේ පක්ෂයකි. ඔබ මතක තබා ගත යුතු කරුණක් වන්නේ බලගතු කම්කරු පන්ති විප්ලවයක් තබා බලගතු කම්කරු ව්‍යාපාරයක් වත් ඇමරිකාවේ පැන නැගී නැත යන්න යි. 1905 නොමැති ව, 1917 දී අපට ජයග්‍රාහී වීමට ඉඩක් පැවතියේ නැත. මගේ පරම්පරාව ඉතා තුරුණු විය. දොළොස් අවුරුද්ද තුළ දී අපේ පරාජයන් තේරුම් ගැනීමට, ඒවා නිවැරදි කර ගැනීමට හා ජයග්‍රහණය කිරීමට අපට හොඳ අවස්ථාවක් වුණෙමු. අප පක්ෂය විසින් ඇමරිකානු කම්කරු පන්තිය කෙලින් ම ජයග්‍රහණය කරා මෙහෙයවනු ලැබෙතැයි අපට කිව නො හැක්කේ මේ නිසා ය. දේශමාමක වන, ඉහළ ජීවන තත්ත්වයන්ගෙන් යුත් ඇමරිකානු කම්කරුවන්ගේ කැරලි හා ස්ට්‍රයික් ඇති වීමට ඉඩ තිබේ. එක් අතකින් හේග්, අනික් අතින් ලෙවිස් වසර ගණනාවක දිගු කාලයක් පුරා එය පැවතිය හැකි ය. මේ කාලය තුළ දී අපේ අය පන්නරය ලබමින් තමන් ගැන ම වඩ වඩා විශ්වාසවත් වනු ඇත. එවිට දී "මාවත දැක ගැනීමට සමත් වූ එකම කොටස ඔවුන් පමණකි" යි කම්කරුවන් කියනු ඇත. ආරම්භය සඳහා අපට විශිෂ්ට කොටස් සිටී. ඉතා හොඳ බැරෑරුම් ලෙස අධ්‍යයනය ලත් මිනිස්සු, හොඳ නිල මඬුල්ලක් හා කුඩා නොවන නිල මඬුල්ලක් සිටිති. මෙම, වඩාත් පොදු අර්ථයෙන්, මම පරිපූර්ණ ලෙස සාරදර්ශී වෙමි. එසේ ම ඇමරිකානු කම්කරුවන් ගේ මනෝගතියෙහි වෙනස සාරදර්ශී වෙමි. එසේ ම ඇමරිකානු කම්කරුවන් ගේ මනෝගතියෙහි වෙනස ඉතා වේගවත් රිද්මයකින් එළඹෙනු ඇතැයි ද මම විශ්වාස කරමි. කුමක් කළ යුතු ද? අලුත් යමක් සොයමින් සියල්ලෝ නො ඉවසිලිවත් ව සිටිති. එය විප්ලවවාදී ප්‍රචාරයට අතිශයින් වාසිදායක ය.

ප්‍රභූ කොටස පමණක් නොව ඉතා ම දුගී කොටස් ද අප මතක තබා ගත යුතු ය. සංස්කෘතියෙන් දියුණු ඇමරිකානු කම්කරුවන් තුළ ඉංග්‍රීසි ක්‍රීඩා වැනි ධන හා ඍණ ලක්ෂණ පවතී. එය ඉතා හොඳ වන අතර කම්කරුවන් අධෛර්ය කරවන යන්ත්‍රණයක් ද වෙයි. සියලු විප්ලවවාදී ශක්තීන් ක්‍රීඩාවලට වැය කෙරෙයි. ධනපති ජාතීන් අතරින් ඉතා ම බුද්ධිමත් ජාතිය වන බ්‍රිතාන්‍යයන් විසින් එය වගාදිගා කරන ලදි. විප්ලවවාදී අධ්‍යාපනයේ කොටසක් ලෙස ක්‍රිඩා පැවතිය යුත්තේ වෘත්තිය සමිති අතය. මේ දේවල් සඳහා අවශ්‍ය තරම් අතමිට නැති තරුණයන්ගෙන්විශාල කොටසක් හා ස්ත්‍රීහු වෙති. සෑම තැනක් ම ගැඹුරු ම ස්තරයන් දක්වා විනිවිදීමට ඉස්කෙඳි අප සතු විය යුතු ය.

ප්‍රශ්නය : පසු ගිය සම්මේලනයෙන් පසු පක්ය ඉමහත් ඉදිරි පියවරක් තබා ඇතැයි මම සිතමි.

ට්‍රොට්ස්කි : ඉතා වැදගත් හැරීමක් ගෙන තිබේ. දැන් අවිය උදෙසා සංකේන්ද්‍රිත ක්‍රියාවක් ලබා දිය යුතු ය. පොදු හා විසිරුණු උද්ඝෝෂණ නූගත් කොටස්වල මනස විනිවිදින්නේ නැත. එහෙත් තත්ත්වයට අනුකුල කරමින් ඔබ එක ම සටන් පාඨ පුනරුච්චාරණය කරත් නම්, ඉගැන්වීමේ මාතෘ

වන පුනරුච්චාරණය දේශපාලනයේ දී ද සමාන ක්‍රියාවලියක් ඉටු කරනු ඇත. බුද්ධිමතා සම්බන්ධයෙන් පමණක් නො ව කම්කරුවා සම්බන්ධයෙන් ද බොහෝ විට සිදු වන යමක් වන්නේ, තමා උගත් දේ සියල්ලන්ට අවබෝධ වෙතැයි ඔහු විශ්වාස කිරීමයි. අවධාරණාත්මක ලෙස පුනරුච්චාරණය කිරීම, දිනපතා මාර්ගයේ කර්තව්‍ය එයයි. සජාතීය ලාංඡනයක් නිකුත් කිරීම යි.

පරිවර්තනය: විජේ ඩයස්